---

මාතලේ ප්‍රාදේශීය සභාව

මාතලේ දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

---

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 26 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය

---

මෙම වාර්තාවේ ඇතුළත් අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු මාතලේ ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

1:3:1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

---

ගබඩා ද්‍රව්‍ය මිළදී ගැනීමේදී හා නිකුත් කිරීමේදී ගබඩා අත්තකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කර නොතිබුණි.

1:3:2 ගණකාධිකරණ අඩුපාඩු

---

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තුව රු.25,875 ක් වූ අතර එම ශේෂය සහ වර්ෂයේ හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තුව රු.21,425 ක් වශයෙන් එකතුව රු.47,300 ක් වූ සමුච්චිත හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තුව ආදායම් ණයගැතියන් ලෙස ගිණුම්වල පෙන්විය යුතු වුවත්, එය උසාවි දඩ ආදායම් ගිණුමට හර කර පෙන්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන තිබුණු වරිපනම් අධිගාස්තු රු.88,265 ක් හා අක්කර බදු අධිගාස්තු රු.1,881 ක් වෙනත් ආදායම් යටතේ දැක්විය යුතු වුවත්, උසාවි දඩ ආදායම් ලෙස පෙන්නුම් කර තිබුණි.

(ඈ) ආයුර්වේද ඖෂධ සංස්ථාවෙන් පරිත්‍යාග ලෙස ලැබෙන ඖෂධ තොගවල වටිනාකම ගිණුම්වල හෙළිදරව් කළ යුතු වුවත් එසේ කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළදී රු.206,500 ක් වටිනා ඖෂධ තොග ලැබීම් සහ දෙසැම්බර් 31 දිනට ඉතිරි තොගය රු.134,035 ක් ඒ පරිදි ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩකාමර කුලිය රු.850 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) විෂය නිමවුම් වාර්තා අනුව ගොඩනැගිලි ඉදිකිරීම් වල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.5,034,446 ක් වුවද එය රු.4,213,648 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා රු.820,798 ක් අඩුවෙන් ගිණුම් වල පෙන්නුම් කෙරේ.

(ඊ) සභාව සතු රු.680,000 ක් වටිනා ඉඩම් කට්ටි 07 ක වටිනාකම ගිණුම්ගතකර නොතිබුණි.

(උ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතුව තිබූණු රු.237,455 ක විශ්‍රාම වැටුප් දායක මුදල් වෙනුවෙන් ගිණුම්වල ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඌ) රු.268,220 ක් වැය කර ජල මීටර් 100 ක් මිලදී ගෙන තිබූණු අතර, එම තොගය ගබඩා තොග ගිණුමට හර කරනු වෙනුවට යන්ත්‍ර සූත්‍ර යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.

(එ) ඉඩම් මැනීම සඳහා වැය කරන ලද රු.85,500 ක් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඒ) ඉකුත් වර්ෂයට අදාළව අවස්ථා 35 කදී අයකරගෙන තිබූණු රු.111,715 ක ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් පෙන්නුම් කෙරේ.

(ඔ) සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවිය යුතු රු.729,511 ක වියදම් සඳහා ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබීම නිසා වර්ෂයේ වියදම සහ වියදම් ණයහිමියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණ අතර, වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් පෙන්නුම් කෙරේ.

1.3.3 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයකට අදාළ පාලන ගිණුම් අනුව ශේෂය රු.393,911 ක් වූ අතර උපයෝගී ලේඛන අනුව ශේෂය රු.392,543 ක් විය.

1:3:4 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබුණු ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.1,236,345 ක් විය.

1:3:5 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

2011 මාර්තු 31 දින වන විට විගණන විමසුම් 04 කට පිළිතුරු සපයා නොතිබුණු අතර, එකී විමසුම් වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනු වල වටිනාකම රු.8,256,355 ක් විය.

(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.4,848,028 ක් වූ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කරීමට නොහැකි විය.

1:3:6 අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති, හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ | |
| (1) 129(i)(2)වගන්තිය | බැංකු ගිණුමක් ආරම්භ කිරීම සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, වැටුප් ගෙවීම, සේවක ණය ගෙවීම හා අනෙකුත් ගෙවීම් වෙනුවෙන් අනුමැතියකින් තොරව බැංකු ගිණුම් 03 ක් පවත්වාගෙන ගොස් තිබුණි. |
| (ආ)<u>1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත</u> | |
| 21 වගන්තිය | අනුමත සැලසුම් මත ඉදිකළ නිවාස සම්බන්ධයෙන් පදිංචිවීමට පෙර අනුකූලතා සහතික ලබාගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී සැලසුම් අනුමත කළ ගොඩනැගිලි අයදුම්පත් 226 න් 222 ක් සඳහා ද 2009 වර්ෂයේදී අනුමත කළ අයදුම්පත් 175න් 164 ක් සඳහාද අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. |
| (ඇ)<u>1988 ප්‍රාදේශීය සභා(මූල්‍ය හා පරිපාලන) රීති මාලාව</u> | |
| 5(ii) රීතිය | සභා දේපල සම්බන්ධයෙන් නිසි ආකාරයක රක්ෂණ ක්‍රියාමාර්ගයක් ගෙන ඇති බව සහතික කිරීම සභාපතිවරයාගේ වගකීම වුවද, සභාව සතු ත්‍රිරෝද රථයේ හා යතුරු පැදි 03 ක් සම්බන්ධයෙන් එකී අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | |
|---|---|
| (i) මුදල් රෙගුලාස 371 | ලබාදෙන ලද තත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්ය නිමවූ වහාම පියවිය යුතු වුවද, අවස්ථා 06 කදී ලබාගත් වටිනාකම රු.310,367 ක් වූ අත්තකාරම් වර්ෂ 03 කට අධික කාලයක් ගතවී තිබුණද 2011 ජුනි 30 දින දක්වා පියවා නොතිබුණි. |
| (ii) ) මුදල් රෙගුලාසි 1646 | සභාව සත යතුරු පැදි 03 ක හා අත්ට්‍රැක්ටරයකට අදාළ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණ අතර, වාහන 07 ක ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කිරීමේ දී මාස 01 සිට මාස 06 දක්වා ප්‍රමාදයන් දක්නට ලැබුණි. |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2:1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,083,182 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.2,193,019 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | 880 | 913 | 684 | 823 | 822 | 500 |
| (ii) බදු කුලී | 686 | 82 | 43 | 63 | 47 | 220 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,597 | 1,470 | 21 | 1,356 | 1,330 | 27 |
| (iv) වෙනත් ආදායම් | 24,284 | 9,534 | 8,638 | 4,794 | 7,796 | 4,700 |

අයවිෂයයන් 18 කට අදාළව ඇස්තමේන්තුගත ආදායම් ප්‍රමාණයට සාපේක්ෂව රැස්කිරීම් 0% සිට 63% දක්වා ඉතා පහළ මට්ටමක පැවැතුණි.

2.2.2 වරිපනම් බදු

-------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ)වගන්තියේ විධිවිධාන අනුව 2010 දෙසැම්බර් 31දිනට හිඟව තිබුණු වරිපනම් බදු රු.491,109 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 අක්කර බදු

------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තියේ විධිවිධාන අනුව 2010 දෙසැම්බර් 31 දිනට පැවති හිඟ අක්කර බදු රු.192,689 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2:2:4 උසාවි දඩ මුදල්

-----------------

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු.1,212,301 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.2.5 මුද්දර ගාස්තු

-------------

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු3,275,280 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාළ විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. '000 | රු. '000 | රු '000 | රු. '000 | රු. '000 | රු '000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 15,238 | 13,148 | 2,090 | 13,924 | 12,460 | 1,464 |
| අනෙකුත් | 10,809 | 10,517 | 292 | 9,339 | 12,264 | (2,925) |
| උපඑකතුව | 26,047 | 23,665 | 2,382 | 23,263 | 24,724 | (1,461) |
| ප්‍රාග්ධන වියදම | 17,145 | 54,153 | (37,008) | 19,040 | 25,330 | (6,290) |
| මුළු එකතුව | 43,192 | 77,818 | (34,626) | 42,303 | 50,054 | (7,751) |

2.4 අධිභාර

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(3) වගන්තියේ විධිවිධාන යටතේ වගකිව යුතු පුද්ගලයන්ට එරෙහිව මවිසින් පනවන ලද අධිභාර අනුව 2010 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණ අධිභාර අගය රු.36,883 ක් විය.

(ආ) රු.1,639,825 ක අගයකට වූ ගනුදෙනු සම්බන්ධයෙන් මා විසින් ඉදිරියේදී අධිභාර පයවර ගැනීමට යෝජිතව ඇත.

2.5 මානව සම්පත් කළමනාකරණය

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 01 | 01 |
| ද්විතියික | 15 | 15 |
| ප්‍රාථමික | 17 | 14 |
| වෙනත්(අනියම් ,තාවකාලික) | - | 27 |

2.6 වත්කම් කළමනාකරණය

2.6.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවති වටිනාකම රු.484,806 ක් වූ වාහන හා කාර්යාල උපකරණ නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය විය.

2:6:2 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.9,000,185 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.1,261,060 ක් විය.

2:6:3 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු සේවක ණය අත්තකාරම් ශේෂ වල එකතුව රු.2,526,889 ක් වූ අතර,අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.116,469 ක් විය.

2.6.4 අචල ජංගම වත්කම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අචලව පවතින වත්කම්වල අගය රු.951,293ක් විය.

2:6:5 සමීක්ෂණය නොකළ වත්කම්

භෞතික පරීක්ෂණ/සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ වත්කම්වල වටිනාකම රු.134,035 ක් විය.

2.7 අවිධිමත් ගනුදෙනු
--------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 19 හා 132 වගන්තියේ නිතිමය ප්‍රතිපාදන සලසා නොමැති කාර්යයක වන සෙන්කෝලය සැදීම සඳහා සභා අරමුදලින් සමාලෝචිත වර්ෂයේදී රු.15,500 ක් වැය කර තිබුණි.

(ආ) අමාත්‍යවරයාගේ හා පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතියකින් තොරව දෛනික දීමනා මත පුහුණු ලාභිණියක සේවයේ යොදවාගෙන සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා රු.66,600 ක් දීමනා ගෙවා තිබුණි.

(ආ) 2009 වර්ෂයේදී පෙර පාසැල් ළමුන් සඳහා නිල ඇඳුම් මිළදී ගැනීම සඳහා එළඹී සභා තීරණ පරිදි 2010 වර්ෂයේදී ද ප්‍රතිපාදන වෙන්කර නොගෙන 2010 මැයි 05 දිනැති අංක 474 වවුචරයෙන් රු.116,471 ක් ගෙවා තිබුණි. මේ සඳහා වූ ප්‍රතිපාදන පෙර පාසැල් සංවර්ධනය කිරීම සඳහා වූ 609(3) වැය ශීර්ෂයෙන් රු.100,000 ක් හා වෙනත් වැය ශීර්ෂ කිපයකින් රු.16,471 ක් මාරුකරගෙන තිබුණි. 1988 ප්‍රාදේශීය සභා(මුල්‍ය හා පරිපාලන)රීති 208 ට අනුව පුවත්පත් දැන්වීමක් පළකර මිළදී ගැනීම් කළ යතු වුවත්, එවැනි ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණු අතර, නිලඇඳුම් බෙදාදුන් ආකාරය පිළිබඳ විස්තර ද ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) ඉංග්‍රිසි පාඨමාලාවක් ආරම්භ කිරීම සඳහා රු.2,507 ක් වැය කර ලිපි ශීර්ෂ 850 ක් හා ළමුන්ගේ මූලික දැනුම පරික්ෂා කිරීම සඳහා ප්‍රශ්න පත්‍ර 1000 ක මුද්‍රණය කර තිබුණු අතර, පැමිණීමේ ලේඛනය අනුව මේ සඳහා සහභාගි වී තිබුණේ 13 දෙනෙකු පමණි.ඉංග්‍රිසි පාඨමාලා උපදේශකට වැය ශීර්ෂ 301 ට හර කර රු.30,593 ක දෛනික වැටුප් ගෙවා තිබුණු අතර, වැටුප් ගෙවීම සඳහා විධිමත් අනුමැතියක් නොතිබුණි.

2.8 මෙහෙයුම් අකාර්යක්ෂමතා
---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභා මනත්‍රී ප්‍රතිපාදන යටතේ මාළු විකිණීමේ ස්වයංරැකියාවකට අවශ්‍ය තරාදියක්, පිහියා 02ක් හා ඇසුරුම් පෙට්ටියක් මිළදී ගැනීම සඳහා බාහිර තැනැත්තියකට රු.20,000 ක් ලබාදී තිබුණද ,ස්ථානිය පරික්ෂණයේදී ඇය විසින

එහි මාළු විකණිමේ ව්‍යාපාරයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර, මාළු විකිණිම සඳහා වෙළඳ බලපත්‍රයක්ද ලබාගෙන නොතිබුණි.

(ආ) ගෙවීම් බිල්පත් වලින් අඩුකරගෙන තිබූ රඳවාගැනීමේ බදු මුදල් රු.84,084 ක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය නොකර තැන්පතු ගණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ) පළාත් සභා මන්ත්‍රී සංවර්ධන ව්‍යාපෘත ආධාර යටතේ පරණ දොඹවෙල ගොඩහේන්වත්ත ඒකාබද්ධ සුහසාධක සමිතිය වෙත රු.15,000 ක මුදලකට ජ්.අයි.සෙවිලි තහඩු 30 ක් ලබාදී තිබුණද, එකී වියදම ප්‍රතිපුරණය කරගෙන නොතිබුණි.

## 2.9 වාහන අලුත්වැඩියාව

අංක 252-6529 දරන කැබ්රථයට අළුත්වැඩියා කරන ලද එන්ජමක් සපයා සවිකිරීම වෙනුවෙන් 2010 පෙබරවාරි 10 දින රු.220,000 ක් වැයකර තිබුණි.වාහනයට අලුතින් එංජම සවිකිරීමට පෙර වාහනය මාතලේ ඩිපෝ ඉංජිනේරුවරයා විසින් පරීක්ෂා කර ඇති අතර ඔහුගේ 2009 මාර්තු 06 දිනැති වාර්තාව අනුව රියදුරුගේ නොසැලකිලිමත්කම නිසා තෙල්කාන්දු වී කට්ටල් හා උපකට්ටල් අකාලයේ අසාර්ථක වී ඇති බව වාර්තා කර තිබුණි.

මාතලේ ඩිපෝ ඉංජිනේරුවරයා 2009 දෙසැම්බර් 25 දින කැබ්රථය පරීක්ෂා කර බලා කැබ්රථයට සවිකර ඇති එන්ජම ධාවනය කළ හැකි සාර්ථක තත්ත්වයේ පවතින බව සහතිකයක්දී තිබියදී 2010 ජුලි 08 දිනැති රියදුරුගේ ලිපිය පරිදි එම රථයට අලුත් එංජමක් සවිකිරීමට රු.94,490 ක් වටිනාකමැති අමතර කොටස් ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම පරිදි ගනු ලැබූ සභා සම්මුති මත එම ගෙවීම සිදුකර තිබුණි.එසේම ඉවත් කරන ලද වාහන කොටස් සභාව වෙත ආපසු භාරදී නොතිබුණි.

## 2.10 හදුනාගන්නා ලද පාඩු

ගබඩා තොග ශේෂ පිළිබඳව 2011 ජනවාරි 25 දින කරන ලද භෞතික තොග ශේෂ පරීක්ෂාවකදී රු.28,932 ක වටිනාකමට වූ තොග විෂයයන් 07ක ඌණතාවයක් හා රු.7,170 ක වටිනාකමට වූ තොග විෂයයන් 03 ක අතිරික්තයකද නිරීක්ෂණය විය.

## 2.11 කොන්ත්‍රාත් පරිපාලනය

ව්‍යාපෘත ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාද

පහත දැක්වෙන ව්‍යාපෘත ක්‍රියාත්මක කිරීමේ දිර්ඝ ප්‍රමාදයන් දක්නට තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භකළ දිනය | නිම කිරීමට ඉලක්ක කළ දිනය | 2010 දෙසැම්බර් 31 දින දක්වා දරන ලද වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|
| | රු. | | | රු. | |
| (i )වල්ලිවෙල ආදාහනාගාරය ඉදිකිරීම | 5,964,402 | 2010 ජුලි 12 | 2011 ජනවාරි 12 | 2,921,938 | ප්‍රාදේශීය සභාවේ මූල්‍ය අර්බුදය හා වර්ෂාපතනය |
| (ii).කොම්පොස්ට් අංගනය වටා වැටක් සකස් කිරීම | 440,000 | 2009 නොවැම්බර් 12 | 2010 ජනවාරි 12 | 225,215 | අයහපත් කාලගුණික තත්ත්වය |

## 2.12 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 3 . පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) අභ්‍යන්තර පාලනය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) ණයගැති හා ණයහිමි ශේෂ පාලනය
(ඊ) සේවක ණය පාලනය